**ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව අංශයේ (TVET) පෞද්ගලික අංශය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා නව්‍ය ප්‍රවේශයන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය (නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ප්‍රදාන) - 2022**

---

**ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව අංශයේ (TVET) පෞද්ගලික අංශය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා නව්‍ය ප්‍රවේශයන් ඇතිකිරීමේ ව්‍යාපෘතියේ (නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ප්‍රදාන) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 11 දින එළඹි අංක 9193 එස්ආර්අයි (එස්එෆ්) දරන ප්‍රදාන ගිවිසුමේ (iv) ව්‍යවස්ථාවේ 4.02(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ,අරමුණු ,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, එවකට නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීමට සහ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව තුළින් කාන්තා ආර්ථික සවිබල ගැන්වීමට දායක වීම ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වේ. (i) තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා පුද්ගලික අංශයේ දායකත්වය ශක්තිමත් කිරීම (ii) කාන්තාවන් කෙරෙහි අවධානය යොමු කරමින් ස්වයං රැකියා සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන වැඩි දියුණු කිරීම (iii) සාම්ප්‍රදායික නොවන ක්ෂේත්‍රවලට කාන්තාවන් ආකර්ෂණය කර ගැනීම සඳහා කාන්තාවන් ඉලක්ක කරගත් දිරිගැන්වීම් ලබා දීම, උපදේශනය සහ රැකියා පුහුණුව (iv) පෞද්ගලික අංශයේ ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළත් බඳවා ගැනීම් සහ සේවා පරිසරය ඇති කිරීම (v) නිපුණතා අංශයට කොවිඩ්-19 බලපෑමට කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීම යනාදි සංරචක 5 කින් ව්‍යාපෘතිය සමන්විත වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 534කට සමාන එ.ජ.ඩො මිලියන 3ක් වන අතර දරිද්‍රතාව අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල ප්‍රදානයක් ලෙස මූල්‍යනය කිරීමට එකග වූ අතර ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුව පරිපාලනය කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 නොවැම්බර් 16 දින ආරම්භ කරන ලද අතර 2021 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, 2023 ජුනි 30 දක්වා දෙවතාවක් දීර්ඝ කර තිබුණි.**

**1.3 තත්ත්වාගණනය කළ මතය**

**මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කරන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් විස්තරය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ආසියානු සංවර්ධන බැංකුවෙන් රු.මිලියන 469.96ක් ලැබී තිබුණුද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.මිලියන **280.14**ක් පමණක් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන මූල්‍ය ක්‍රියාකාරකම් සහ මුදල් හා මුදල් හා සමාන දෑ අවසන් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 189.69 | (i) සමාලෝචන වර්ෂය තුළ රු. මිලියන 469.84න් ව්‍යාපෘතිය රු. මිලියන 280.14ක් ආපසු ගැනීම සිදු කර ඇත. එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය පෙන්වනු ලැබේ. ඉතිරිය රු. මිලියන 189.69 ශ්‍රී ලංකා මහ බැංකු ගිණුමේ පවතී. කෙසේවෙතත්, මුළු මුදලම මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සහ සටහන් අංක 7 දැක්වේ.<br>(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ශ්‍රී ලංකා මහ බැංකු ගිණුමේ ශේෂය පෙන්වන්නේ නම්, රු. මිලියන 238.27ක් (රු. 189.69 + රු. 48.56) ගිණුමේ නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය කළ හැකි අතර එම මුදල සමාලෝචන වර්ෂය තුළ වියදම් කළ මුදලට (රු. මිලියන 219.14) වඩා වැඩි වේ. | ප්‍රදාන නියෝජිතායතනයෙන් ලැබුණු මුළු මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ පෙන්විය යුතුය. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ 2021 වර්ෂයේ මුදල් ගලා ඒම සහ පිටතට ගලායාම පෙන්වනු වෙනුවට සමුච්චිත ව්‍යාපෘති වියදම්, වෙළඳ සහ ගෙවිය යුතු දෑ සහ මූල්‍ය කටයුතු පිළිවෙළින් රු. මිලියන 103, රු. මිලියන 24.50ක් සහ රු. **78.07**ක් ලෙස සංසන්දනාත්මක සංඛ්‍යා දක්වා තිබුණි. | 98.62 | 2022 දී මුදල් ප්‍රවාහයේ සංසන්දනාත්මක සංඛ්‍යා 2021 විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයෙන් ලබා ගන්නා ලදී. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා ඒම සහ පිටතට ගලායාම පෙන්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ (ඩොලර්) ගිණුමේ රු. 129,545ක විනිමය අලාභයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස වෙනම හඳුනා නොගෙන ආසියානු සංවර්ධන බැංකුවේ දායකත්වයෙන් අඩු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුවේ සම්පූර්ණ දායකත්වය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 0.13 | විනිමය ලාභ/අලාභ ගිණුමගත කිරීමට වෙනම අයවැය කේතයක් නොමැත. මෙම තත්ත්වයන් තුළ, විනිමය ලාභ/අලාභ ව්‍යාපෘති වියදමක්/ආදායමක් ලෙස ගිණුම්ගත කළහොත් එය ව්‍යාපෘති අරමුණු නොමඟ ලැබේ. | ආසියානු සංවර්ධන බැංකුවේ දායකත්වයේ රුපියල් අගය මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ නිවැරදිව දැක්විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 5ක් යටතේ සිදු කරන අතර භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (1) | **ප්‍රතිඵල 01**<br>ගිවිසුමේ ඇතුළත් සවිස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුවට අනුව, උප ක්‍රියාකාරකම් 5ක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිඵල 01 යටතේ ආරම්භයේදී එ.ජ.ඩො 464,000ක් වෙන් කර තිබුණි. පසුව, පළමු හා දෙවන කාල සීමාව තුළ එය එ.ජ.ඩො. 140,728 දක්වා 69%කින් අඩු විය. කෙසේවෙතත්, ඉන් 2022 දෙසැම්බර් 31 දිනට 26% නියෝජනය කරන රු.මිලියන **7.35**කට සමාන එ.ජ.ඩො 35,900 පමණක් භාවිත කර තිබුණි. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) | උප ක්‍රියාකාරකම් 1.4.2 යටතේ කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණු උපාධිධාරීන්ගේ (විශේෂයෙන් කාන්තාවන්) රැකියා වැඩි කිරීම සඳහා උප ව්‍යාපෘති 12 ක් ආරම්භයේදී ක්‍රියාත්මක කිරීම සඳහා කර්මික සභාව සහ නිපුණතා සංසදයට තාක්ෂණික සහාය ලබා දීම අරමුණ වුවද, **2022** වර්ෂය අවසාන වන විට රු. 242,074ක උප ව්‍යාපෘති 01 ක් ඇතුළුව එවැනි උප ව්‍යාපෘති 3 ක් පමණක් සිදුකර | සියලුම කාර්මික අංශ නිපුණතා සභා (ISSC) ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන ලද අතර එක් එක් සභාව සඳහා උප ව්‍යාපෘති ආරම්භ කිරීමට යෝජනා කරන ලදී. තවද මෙම ව්‍යාපෘතිය මගින් එක් එක් සභා සඳහා උපාය මාර්ග සහ මෙහෙයුම් සැලසුම් සකස් කර ඇති අතර යෝජනා සකස් කිරීමට ඔවුන්ට මග | ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. තවද, සැලසුම් සහ අධීක්ෂණ ආකෘතිය අනුව, අවම වශයෙන් එක් කාර්මික සභාවක් හෝ නිත්‍ය ආදායම් මාර්ගයක් උත්පාදනය කර නොතිබුණි. | පෙන්වා ඇත.<br>ISSC තුනක් විසින් ක්‍රියාත්මක කළ හැකි උප ව්‍යාපෘති තුනක් යෝජනා කර ඇත. 2022 දෙසැම්බර් අවසානය වන විට ISSC තුනක් සමඟ මෙම උප ව්‍යාපෘති තුන ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී.<br>සමස්තයක් වශයෙන් ගත් කල, මුළු රටම කොවිඩ් සහ ආර්ථික පරිහානියට මුහුණ දී ඇති අතර, ඒවා ISSC වලටද බලපා ඇති අතර, එකඟ වූ ව්‍යාපෘතිය නියමිත වේලාවට ආරම්භ කිරීමට ඔවුන්ට නොහැකි විය.<br>ආදායම් උත්පාදනය පෙන්වීමට ව්‍යාපෘති සංයුක්ත කළ යුතුය. නමුත් 2022 වර්ෂය තුළදී ආදායම පෙන්වීම සඳහා ව්‍යාපෘති නිමකිරීමට ISSC වලට නොහැකි විය.<br>ආදායම් ප්‍රභවය මැනීම සඳහා උප ව්‍යාපෘති නිම කිරීමට අවශ්‍ය වූ නමුත් 2022 අවසානය වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පැවතුනි. | |
| (ආ) | ව්‍යාපෘති සැලසුම් සහ අධීක්ෂණ රාමුවට අනුව, 4.1.1.1 ට සමගාමීව 1.4.2 යටතේ අවම වශයෙන් කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 500ක් පෞද්ගලික අංශයේ රැකියා සොයා ගත යුතු බවට කාර්මික සභා ඉලක්කයක් තිබුණි. කෙසේවෙතත්, ඇතුළු වූ ගිවිසුම් 16න්, ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා සේවා යෝජකයන් 10 දෙනෙකුට පමණක් මුදල් ලබා දී ඇති අතර පත්වීම් ලිපිවලට අනුව රැකියා ලබා දී ඇත්තේ කාන්තාවන් 10 දෙනෙකුට පමණි. | ගිවිසුම් අත්සන් කළ සමාගම් 16ක් ඔවුන්ගේ උප ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් සිටි අතර ඔවුන් වසර (2022) අවසාන වන විට කාන්තා කාර්ය මණ්ඩලය බඳවා ගනිමින් සිටියහ. වාර්තාවලට අනුව කාර්ය මණ්ඩලය 67ක් බඳවාගෙන ඇත. එසේ වුවද, සියලුම සමාගම් එකල ඔවුන්ගේ උප ව්‍යාපෘති අවසන් කර නොමැත. තවද, රටේ පැවති ආර්ථික අවපාතයත් සමඟ පෞද්ගලික අංශයේ නව බඳවා ගැනීම් දුෂ්කර විය. | ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය |

(2) <u>ප්‍රතිඵල **02**</u>

සවිස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුවට අනුව, ප්‍රතිඵල 02 යටතේ ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා කාන්තාවන් ඉලක්ක කරගනිමින්

| | | | |
|---|---|---|---|
| | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සංශෝධිත ඇස්තමේන්තුවෙන් එ.ජ.ඩො 968,372ක් වෙන් කරන ලදී. ඒ අනුව අරමුණු ඉටුකර ගැනීම සඳහා උපක්‍රියාකාරකම් 35 හඳුනා ගෙන ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (අ) | ව්‍යාපෘතිය අවසානයේ සිදු කිරීමට අවශ්‍ය මූලික හා බලපෑම් අධ්‍යයනයන් හැර ක්‍රියාකාරකම් 35 න් 18 ක් 2022 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර නොතිබුණු අතර ඒ සඳහා රු. 163,795,378 කට සමාන එ.ජ.ඩො 541,598ක මුදලක් වැය කර තිබුණි. | ක්‍රියාකාරකම් 35 ලැයිස්තුව යනු ව්‍යාපෘතියේ සම්පූර්ණ ක්‍රියාකාරකම් ලැයිස්තුව වන අතර අප 2022 වර්ෂය සඳහා කළ ක්‍රියාකාරකම් පමණක් මූල්‍ය වාර්තා බෙදාගෙන ඇත. සමහර අයවැය අයිතම පසුගිය වර්ෂ තුළ දැනටමත් අවසන් කර ඇති අතර සමහර අයවැය ක්‍රියාකාරකම් අවසානයේ සිදු කිරීමට අවශ්‍ය වේ. | ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | උප ක්‍රියාකාරකම් 2.4.1 යටතේ ක්‍රියාකාරකම් 5ක් හරහා කාන්තා ව්‍යවසායකයින් සඳහා උපදේශනය සහ ව්‍යාපාර උපදේශනය ලබාදීමට සංශෝධිත ඇස්තමේන්තුවෙන් එ.ජ.ඩො 120,000ක් වෙන් කර තිබුණි. කෙසේවෙතත්, එම උප ක්‍රියාකාරකම් සමඟින් කිසිදු අපේක්ෂිත ප්‍රතිඵලයක් අත් කර ගැනීමට නොහැකි වී ඇත. | දැනට සිටින ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුකරුවන් 70 දෙනා කිසිදු පිරිවැය පදනමක් නොමැතිව ව්‍යවසායකයින් සඳහා අඛණ්ඩ උපදේශන සහ ව්‍යාපාරික උපදේශන ලබා දී ඇත. එබැවින් මෙම කටයුතු සඳහා අයවැය වියදම් නොතිබුණි. මෙම අයවැය ව්‍යාපෘතියේ අවසාන අදියරේදී ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ඇතිව අමාත්‍යාංශයට අනුයුක්ත නිලධාරීන් 46 දෙනෙකු සඳහා තවත් පුහුණුවන්නන් පුහුණු කිරීම් (TOTs) 2ක් සිදුකිරීමට භාවිත කර ඇත. | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත හඳුනාගත් උප ක්‍රියාකාරකම් සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලැබී ඇති තොරතුරුවලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට 2.6.1 උප ක්‍රියාකාරකම් යටතේ කණ්ඩායම් 47න් ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ප්‍රදානලාභීන් 423 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් 32ක් සඳහා රු. මිලියන 59.19ක් ලබා දී ඇති අතර ව්‍යාපාර පුළුල්කිරීම සඳහා ප්‍රදානලාභීන් 158 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් 15ක් සඳහා රු. මිලියන 61.58ක් ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |

| | | |
|---|---|---|
| (i) අදාළ ව්‍යාපෘති කාල සීමාවෙන් ඔබ්බට වසරක් ගත වී ඇතත්, ගිවිසුමේ සඳහන් දෙවන මංසන්දිය වන ව්‍යාපාර ලියාපදිංචිය ලබාගෙන නොමැති බව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ලබාදෙන ලද ප්‍රදානලාභීන් 250 දෙනෙකුගෙන් සිදුකරන ලද නියැදි විගණනයේදී නිරීක්ෂණය විය. | ආර්ථික අර්බුදය, උතුරු පළාතේ තේසවලාමේ නීතිය, ඉඩම් අයිතිය පිළිබඳ ගැටලු ව්‍යාපාර ලියාපදිංචිය ප්‍රමාද වීමට හේතු කිහිපයක් විය. | ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා නීතිමය තත්ත්වයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) ව්‍යාපාර පුළුල් කිරීම සඳහා ලබා දී ඇති ප්‍රදාන 90ක නියැදි විගණනයේ දී, නව සේවකයින් බඳවා ගැනීමේ දෙවන මංසන්දිය අදාළ ප්‍රදානලාභීන් විසින් සපුරා නොමැති බව නිරීක්ෂණය විය. | රටේ වත්මන් ආර්ථික පසුබෑම හේතුවෙන් බොහෝ ව්‍යාපාර පැවැත්ම සම්බන්ධයෙන් අභියෝගවලට මුහුණ දී තිබේ. මෙම තත්ත්වය තුළ අතිරේක කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම ව්‍යාපාරයට අහිතකර බලපෑමක් ඇති කරයි. බොහෝ විශාල සමාගම් පවා ආර්ථික අර්බුදය යටතේ ශ්‍රම බලකාය අඩු කර ඇත.<br>එබැවින් ව්‍යාපෘතිය නව බඳවා ගැනීම් සමඟ ව්‍යාපාරය පුළුල් කිරීමට වඩා ව්‍යාපාරය දිගටම කරගෙන යාමට සහ ව්‍යාපාරයේ රැඳී සිටීමට අපේක්ෂා කළේය. | මංසන්දි සාක්ෂාත් කර ගැනීම පිළිබඳව පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) සාම්ප්‍රදායික ව්‍යාපාරික අංශ 38 ක ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා පිරිමි ව්‍යවසායකයින් 98 දෙනෙකු සහ කාන්තා ව්‍යවසායකයින් 325 දෙනෙකු සඳහා මූල්‍ය සහයන් ලබා දී ඇති බව ලබා දී ඇති ප්‍රදානය විශ්ලේෂණය කිරීමේදී නිරීක්ෂණය විය. එයින් වැඩිම ආධාර මුදල නිවාස සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීමේ ව්‍යාපාර සඳහා ප්‍රදානලාභීන් 119 දෙනෙකුට රු. මිලියන 16.80ක් හෙවත් සියයට 28ක් ද ග්‍රැෆික් නිර්මාණ ව්‍යාපාර සඳහා රු. මිලියන 10.14ක් හෙවත් සියයට 17ක් ද පැල තවාන් ව්‍යාපාර සඳහා රු. මිලියන 7.68ක් හෙවත් සියයට 12ක් ද ලබා දී ඇතත්, පවතින අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් රට තුළ, ඉහත ව්‍යාපාරික අංශවල ඉල්ලුම අඩු වී ඇති බවත්, ව්‍යාපාර සැලැස්මේ සඳහන් ආදායම ලබා ගැනීමට නොහැකි වූ බවත් නිරීක්ෂණය විය. එවැනි තත්ත්වයක් තුළ | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේ දී කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ උපදෙස් මත සාම්ප්‍රදායික නොවන අංශයේ පාඨමාලා 157 ක් ව්‍යාපෘතිය මගින් හඳුනා ගන්නා ලදී. සියලුම තේරීම් සිදු කරනු ලැබුවේ ඉහත සඳහන් පාඨමාලා මත පදනම්ව එක් එක් අයට සමාන අවස්ථා ලබා දීමෙනි. බොහෝ TVET ආයතනවල තිබෙන සමහර පාඨමාලා සඳහා ඉහළ ශිෂ්‍ය සහභාගිත්වයක් පැවතුනි. එම නිසා සමහර අංශවලට ඉහළ සහභාගීත්වයක් තිබූ අතර සේවා සපයන බොහෝ අංශ ව්‍යවසායකත්වය අතින් ඉහළ ප්‍රතිශතයක් ඇත.<br>වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් ඔවුන්ගෙන් සමහරක් ප්‍රතික්ෂේප වුවද විකල්ප ආදායම් උත්පාදන ක්‍රම | නව ව්‍යවසායකයින් අධීක්ෂණයට පසු විපරම් ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | |
|---|---|---|
| නව ව්‍යවසායකයින්ට ව්‍යාපෘති කාල සීමාවෙන් ඔබ්බට තරගකාරී වෙළෙඳපොළ තුළ රැඳී සිටීමේ හැකියාව අවිනිශ්චිත විය. මේ නිසා කාන්තා ආර්ථිකය සවිබල ගැන්වීමේ සහ තාක්ෂණික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශයේ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඉටු වී තිබේද නැද්ද යන්න ගැටලු සහගත විය. | සොයා ගැනීමට හැකි විය.<br>උදා:<br>• ග්‍රැෆික් නිර්මාණකරුවන් සහ ගෘහනිර්මාණ ශිල්පීන් Fiverr හරහා ජාත්‍යන්තර වෙළඳපොළට ළඟා විය.<br>• නිර්මාණකරුවන් මුද්‍රණ සේවා ද ආරම්භ කළහ.<br>• පැල තවාන් මගින් මල් සහ විසිතුරු පැල වෙනුවට පළතුරු සහ එළවළු පැල හඳුන්වා දෙන ලදී. | |
| (iv) සාම්ප්‍රදායික නොවන සහ නැගී එන අංශ වෙත කාන්තාවන් යොමු කිරීම අරමුණ වුවද, ඉහත විග්‍රහයට අනුව ඉදිකිරීම්, ලී වැඩ, මෝටර් රථ සේවා වැනි කාන්තාවන් අවධානය යොමු නොකරන අංශ සඳහා කාන්තාවන් 23 ක් හෙවත් සියයට 5 ක් පමණක් ප්‍රදාන ලබාදී ඇති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේ දී කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ උපදෙස් මත සාම්ප්‍රදායික නොවන අංශයේ පාඨමාලා 157 ක් ව්‍යාපෘතිය මගින් හඳුනා ගන්නා ලදී. සියලුම තේරීම් සිදු කරනු ලැබුවේ ඉහත සඳහන් පාඨමාලා මත පදනම්ව එක් එක් අයට සමාන අවස්ථා ලබා දීමෙනි. සමහර ව්‍යාපාර ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලද ඉහත පාඨමාලාවල එකම වටිනාකම් දාමය යටතේ පවතී. එබැවින් ව්‍යාපෘති විෂය පථය යටතේ සුදුසුකම්ලත් ව්‍යාපාර සඳහා සියලුම ප්‍රදාන ලබා දී ඇත. | ව්‍යාපෘතියේ ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

(3) <u>**ප්‍රතිඵල 03**</u>

සාම්ප්‍රදායික නොවන සහ නැගී එන ක්ෂේත්‍රවල පාඨමාලා හදාරන කාන්තාවන් 700ක් සඳහාත්, ආරම්භයේදී එම ක්ෂේත්‍රවල සේවය කරන කාන්තාවන් 600 වූ ඉලක්කය කාන්තාවන් 150දක්වා අඩු කිරීමෙන් පසු දිරිදීමනා ලබාදීමට සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1000කට අධික පිරිසකට උපදේශන සහ වෘත්තීය උපදේශන ලබාදීමට මේ යටතේ සැලසුම් කර තිබුණි. එබැවින්, එ.ජ.ඩො 855,000 ක මුදලක් වෙන් කර තිබුණු අතර පසුව එය පළමු සහ දෙවන දීර්ඝ කිරීමේදී එ.ජ.ඩො 135,305 දක්වා සියයට 84 කින් අඩු කරන ඇත. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | උප ක්‍රියාකාරකම් 3.3.1 යටතේ සාම්ප්‍රදායික නොවන සහ නැගී එන අංශවල පාඨමාලා හදාරන සිසුන් 700කට දිරි දීමනා ලබාදීම අරමුණ වුවද 2022 වසර අවසන් වන විට සිසුන් 513කට පමණක් දිරි දීමනා ලබාදී තිබුණි. | ව්‍යාපෘති කාලය අවසන් වන **2023** ජුනි වන විට ව්‍යාපෘතිය මෙම **700** සංඛ්‍යාව දක්වා ළඟා වී ඇත.<br>මෙම 513 පවා පහත ගැටළුවලට මුහුණ දෙමින් ව්‍යාපෘතිය මගින් ලබා ගන්නා ලදී.<br>මෙම දිරිදීමනාව ශිෂ්‍යාවන් සඳහා පමණක් ලබාදෙන අතර ඔවුන්ගේ 80% පැමිණීම අනිවාර්ය වේ. මේ නිසා සමහරුන්ට ලැබෙන ප්‍රතිලාභ අඩුවී ඇත. ඒ වගේම රජයෙන් ලබාදෙන ප්‍රතිලාභ නොලැබෙන අයට පමණක් ව්‍යාපෘති ප්‍රතිලාභ ලබාදෙන ලදි.<br>කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණු අංශයේ සහභාගීත්වය සාපේක්ෂව අඩුය බස්නාහිර පළාතේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 කට පමණක් ප්‍රතිලාභ ලබාදෙන ලදි. | ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **3.4.1** යටතේ සාම්ප්‍රදායික නොවන සහ නැගී එන අංශවල සේවයේ නියුතු කාන්තාවන් **150** දෙනෙකුට දිරි දීමනා ලබාදීම සංශෝධිත ඉලක්කය වුව ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රැකියාස්ථ පුහුණුව සඳහා **42**ක් සහ රැකියා ස්ථානගත කිරීම් සඳහා **77**ක් ඇතුළු කාන්තාවන් **119** දෙනෙකුට පමණක් දිරි දීමනා ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ. | ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේ දී 3.4.1 යටතේ මෙම 600 සඳහන් කළ ද විවිධ ගැටලු හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව ද මේ පිළිබඳව අවධානය යොමු කළ අතර ප්‍රතිඵල **5** 600 ඉලක්කය සංශෝධිත අයවැයෙන් 150 දක්වා අඩු කරන ලදී. මේ වන විට මෙම 600 ඉලක්කය 150 දක්වා වෙනස් කර ඇත. | ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ සංශෝධිත ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ක්‍රියාකාරකම් 3.5.1 යටතේ ප්‍රධාන වශයෙන් 2021 දී රු. 649,500 වීදි නාට්‍ය වාර්තාමය ක්‍රියාකාරකම් සඳහා සහ SSDP හි ක්‍රියාකාරකම් සඳහා පිහිටුවා ඇති නිපුණතා අංශ අංශය විසින් 2022 ජනවාරි 04 වන දින සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේදී පැවැත් වූ නැණවත් කාන්තා දැනුවත් කිරීමේ වැඩසටහන සංවිධානය සඳහා රු. මිලියන 4ක් ඇතුළුව රු. මිලියන 4.70 ට සමාන එ.ජ.ඩො 23,391 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට වැය කර තිබුණි. | ව්‍යාපෘතිය යටතේ තරුණ සිසුන් 962 ක් පමණ දැනුවත් කිරීම සහ උපදේශනය ලබාගෙන ඇත. මෙම අවස්ථාව සඳහා කුඩා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ආදර්ශයක් ලෙස හොඳම ව්‍යවසායකයින් 40ක් පමණ සහභාගී වී ඇත. මෙම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 40ම සාම්ප්‍රදායික නොවන අංශයෙන් වන අතර ඔවුන් තම ව්‍යාපාර වඩා හොඳ ආකාරයෙන් වර්ධනය කර ඇත. | උප ක්‍රියාකාරකම්වල අරමුණ සාක්ෂාත් කරගත යුතුය. |

එබැවින් 3.5.1 යටතේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1000කට අධික පිරිසකට උපදේශනය සහ වෘත්තීය උපදේශනය ලබාදීමේ අරමුණ 2022 දක්වා දරන ලද ඉහත වියදම් තුළ සාක්ෂාත් කර ගැනීම පිළිබඳව විගණනයේදී ගැටළු සහගතවිය.

මෙම උත්සවය දිස්ත්‍රික්ක 14ටම පමණක් නොව මුළු රටේම නෙත් විවර කිරීමක් විය. මෙම කාන්තා ව්‍යවසායිකාවන් සාම්ප්‍රදායික නොවන අංශය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අනාගත කාන්තා ව්‍යවසායකයින් සඳහා ආදර්ශයක් ලෙස සැලකේ.

මෙම වැඩසටහන සමඟ තරුණ කාන්තා දැනුවත් කිරීම සඳහා පමණක් නොව සමස්ත ව්‍යාපෘතිය සඳහාම විශාල ධනාත්මක බලපෑමක් ඇති විය.

හොඳම කාන්තා ව්‍යවසායිකාවන් හැරුණු විට පහත සඳහන් ක්ෂේත්‍රවලසහභාගීත්වය ඇත.

1. පුද්ගලික අංශයේ සමාගම්
2. TVET ආයතනවල දෙපාර්තමේන්තු ප්‍රධානීන්
3. TVET ආයතන කිහිපයක විදුහල්පතිවරුන් සහ සිසුන්.

(4) <u>ප්‍රතිඵල **04**</u>

ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළත් බඳවා ගැනීමේ ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ පුද්ගලික අංශයේ හිතකර සේවා පරිසරයක් ඇති කිරීම සඳහා පුද්ගලික අංශයේ සේවා යෝජකයන්ට සහය ලබා දීම සඳහා එ.ජ.ඩො 267,706 ක මුදලක් වෙන් කරන ලද අතර සේවා යෝජකයින් 20 දෙනෙකුට සහය දැක්වීමට අපේක්ෂා කර තිබුණි. ඉන් සේවා යෝජකයින් 10 දෙනෙකුට සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 16.33 කි ලබාදී තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) සාම්ප්‍රදායික නොවන රැකියාවක් ලෙස විසිතුරු මසුන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 1.91 ක් ලබා දීමට එකඟ වී තිබුණි. එහි අරමුණ වූයේ වැසිකිළි ඉදිකර කාන්තාවන් 06 දෙනෙකු සඳහා නව රැකියා උත්පාදනය කිරීම වේ. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) වවුචරය සමග පැවති තොරතුරුවලට අනුව, අදාළ මිල ගණන් සහ ප්‍රමාණයන් අයිතම ලෙස පෙන්වන ප්‍රමාණ පත්‍රයක් (BOQ) නොතිබුණු අතර ප්‍රදානයලාභීයා වැසිකිළිවල ප්‍රමාණය (දිග x පළල) පමණක් සඳහන් කර ලංසු කැඳවා අඩුම ලංසුකරුට කොන්ත්‍රාත්තුව ලබාදී ඇත. BOQ සකස් කරන උපදේශකයාගේ දිනයක්, අත්සනක් සහ මුද්‍රාවක් නොමැති නිසා, පසුව විගණන විමසුම සමඟ ඉදිරිපත් කරන ලද නව ප්‍රමාණ පත්‍රය පිළිගත හැකි ලියවිල්ලක් නොවීය. | ඉදිකිරීම් සඳහා පදනම ලෙස ප්‍රදානලාභීයා D Homes උපදේශන සමාගමෙන් ප්‍රමාණ පත්‍රය ලබාගෙන ඇත. D Homes සම්බන්ධතා තොරතුරු කවර පිටුවේ සඳහන් කර ඇත. ඔවුන් ආයතනයක් ලෙස ඉදිරිපත් කර ඇති නිසා තනිපුද්ගල අත්සනක් අවශ්‍ය නොවේ. D Homes ප්‍රමාණ පත්‍රය මත පදනම්ව, ප්‍රදානලාභීයා මිල කැඳවීම් ඇගයීමට ලක් කර ඇත. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගෙවීම් වවුචරය සමඟ අදාළ සියලුම උපකාරක ලියකියවිලි ඇත. | උප ප්‍රදාන ලබාදීමේ ක්‍රමවේදයන් විධිමත් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ii) මංසන්ධි සත්‍යාපන ආකෘතියට අනුව, වයඹ පළාත් සම්බන්ධීකාරක විසින් 2022 මැයි 04 වන දින ප්‍රදානලාභීයා විසින් සිදු කරන ලද කාර්යය භෞතිකව පරීක්ෂා කර ඇති බව සඳහන් වුවද, අදාළ නිලධාරියාගේ රාජකාරිය සනාථ කිරීම සඳහා ඊට අදාළ ලිඛිත සාක්ෂි, වාර්තා හෝ බිල්පත් මත සටහනක් නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | පළාත් සම්බන්ධීකාරක විසින් වැඩබිම භෞතිකව පරීක්ෂා කරන අතර ඔහු කොළඹ ව්‍යාපෘති කාර්යාලය සමඟ සම්බන්ධ විය. වැඩබිමෙහි වෙනම සටහනක් තිබීම අවශ්‍ය නොවූ අතර මංසන්ධි සත්‍යාපන වාර්තාව භාවිතා කරන ලද ලේඛනය/ආකෘතියයි. එය විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගෙවීම් වවුචරය සමඟ අමුණා ඇත. | සත්‍යාපනය ක්‍රියා පටිපාටි විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මෙම ව්‍යාපෘතිය මගින් ඌව පළාතේ බිබිල ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික සමාගමකට විවේක කාමර, නවීන නානකාමර වැනි පහසුකම් සහිත සුවපහසු සේවා ස්ථානයක් නිර්මාණය කිරීම සඳහා රු. මිලියන 1.83 ක මුදලක් ප්‍රදානය කර තිබුණි. පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) වවුචරය සමඟ ඇති තොරතුරු අනුව, පුද්ගලික කාර්මික නිලධාරියෙකු විසින් 2022 මාර්තු 05 වන දින රු. මිලියන 3.45 ක් ප්‍රමාණ පත්‍රයක් පමණක් සකස් කර තිබුණි. එය පිළිවෙළින් 2022 පෙබරවාරි 15 සහ 2022 මාර්තු 02 යන දිනවල අත්තිවාරම දැමීම සහ බිත්ති බැඳීම සඳහා ඉන්වොයිසි ඉදිරිපත් කිරීමෙන් පසුව වූ දිනයකි. එබැවින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමෙන් පසු | ගොඩනැගිලි ඉදිකිරීම් ඇස්තමේන්තු සැලැස්ම 2021.08.06 දින මුලින් සකස් කරන ලදී. පසුව ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර ප්‍රදානලාභීයා විසින් අතිරේක අරමුදල් ඉල්ලා ඇති ඉදිකිරීම් කාර්යයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා වෙනම තාක්ෂණික නිලධාරි වාර්තාවක් ලබා ගන්නා ලදී.<br>නමුත් රටේ ආර්ථික උද්ධමනයත් සමඟ ඉදිකිරීම් ද්‍රව්‍යවල විශාල මිල | උප ප්‍රදාන ලබාදීමේ ක්‍රමවේදයන් විධිමත් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණ පත්‍රය සකස් කර ඇති බව නිරීක්ෂණය විය. | වෙනස්වීම් ඇති විය. ගොඩනැගිලි සැලැස්ම රජයේ අදාළ බලධාරීන් විසින් අනුමත කරන ලදී. තවද පෙර ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි සැලැස්ම මත පදනම්ව ඉදිකිරීම් දිගටම කරගෙන යන අතර පසුව ඔවුන් පිරිවැය වෙනස් කිරීමෙන් පසු තවත් ප්‍රමාණ පත්‍රයක් ඉදිරිපත් කර ඇත. දෙකම විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගෙවීම් වවුචරය සමඟ අමුණා ඇත. | |
| | (ii) පවතින ලේඛනයට අනුව, ඉහත ඇස්තමේන්තු සකස් කළ පුද්ගලික තාක්ෂණික නිලධාරියා විසින් කොන්ත්‍රාත්කරු විසින් කරන ලද කාර්යය කිසිදු පිළිගත් සංවිධානයේ ප්‍රධානියා වෙත යොමු නොකර ඔහුගේ නිල මුද්‍රාව සහ අත්සන පමණක් භාවිතා කර සහතික කර ඇති අතර කොන්ත්‍රාත්කරු විසින් වැඩ තාක්ෂණික නිලධාරියාගේ සහතිකය මත බිල්පත් ඉදිරිපත් කර තිබුණු අතර ව්‍යාපෘතිය එම බිල්පත් සඳහා ගෙවීම් කර තිබුණි. එබැවින් ගෙවීම් කිරීමට පෙර වැඩ සහතික කිරීමේ ක්‍රමවේදයක් ව්‍යාපෘතිය විසින් හඳුන්වා දී නොමැති බව නිරීක්ෂණය විය. | තාක්ෂණික නිලධාරියා ඔක්ස්ෆෑම් අමතා ඇත. සංවිධානය එම අවස්ථාවේ ව්‍යාපෘතිය කළමනාකරණය කරන ලදි. තාක්ෂණික නිලධාරියා ඇමතීමට නිශ්චිත පුද්ගලයා නොදන්නා බැවින්, සංවිධානයට ආමන්ත්‍රණය කිරීමේදී ස්වයංක්‍රීයව ප්‍රධානියා ආමන්ත්‍රණය කර පසුව එය අදාළ ව්‍යාපෘති කළමනාකරණ නිලධාරීන් වෙත ලබා දෙන ලදී.<br>අදාළ තාක්ෂණික ධාරිතාවයෙන් සහිත තාක්ෂණික නිලධාරියා විසින් වාර්තා කිරීම හෝ සටහන කොන්ත්‍රාත්කරු විසින් සිදු කරන ලද කාර්යය සම්මත භාවිතයන්ට අනුකූල බව සහතික කර ඇත. | වැඩ සහතික කිරීමේ ක්‍රියා පටිපාටි විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යාංශය විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන මිල ගණන් හා ප්‍රමාණයන්ට අනුව අදාළ ප්‍රදානලාභියා විසින් ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් ඇස්තමේන්තු යථාර්ථවාදී දැයි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් නොකළ අතර ගෙවීම් කිරීමේදී නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම ආදිය ඉහත ඉදිකිරීම්වල පොදු නිරීක්ෂණය විය. | ව්‍යාපෘති මාර්ගෝපදේශ යටතේ එවැනි සත්‍යාපනයක් අවශ්‍ය නොවීය (ADB ලබා දී ඇති මාර්ගෝපදේශ සහ තාක්ෂණික මාර්ගෝපදේශ) | ඉදිකිරීම් ක්‍රමවේද විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව, ප්‍රදානලාභියා අදාළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් 3ක් කැඳවිය යුතුය. කෙසේවෙතත්, පුද්ගලික සමාගමක් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා එක් මිල | මෙම අවශ්‍ය යන්ත්‍රය නිෂ්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ සමාගම් දෙකක් පමණි. තවද මෙය අවශ්‍ය නිෂ්පාදනය සඳහා සකස් කරන ලද යන්ත්‍රයක් විය. එබැවින්, | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| කැඳවීමක් පමණක් කැඳවා 2022 නොවැම්බර් 09 වන දින එක් සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සාධාරණීකරණය කිරීම සඳහා ව්‍යාපෘතියට ලිපියක් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය විය. ඉන්පසුව, ව්‍යාපෘතිය විසින් සාධාරණීකරණය කිරීමට ඉදිරිපත් කරන ලද කරුණු මත පදනම්ව එකඟ වූ මුළු මුදල වූ රු. මිලියන 2.5 2022 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. | මේ දෙක හැර සමාන නිෂ්පාදන මිල ගණන් ලබා ගැනීමට වෙනත් ක්‍රමයක් නොතිබුණි. පවතින මිල ගණන් අනුව අඩුම ලංසුකරු තෝරා ගන්නා ලදී. |

(5) **<u>ප්‍රතිඵල 5</u>**

| | | |
|---|---|---|
| වෘත්තීය හා කාර්මික අධ්‍යාපන පුහුණු ආයතන 40ක අන්තර්ජාල ඉගෙනුම් වේදිකාව සංවර්ධනය කිරීම සඳහා එ.ජ.ඩො 884,000ක් වෙන් කර තිබුණු අතර 2022 වර්ෂය සඳහා එ.ජ.ඩො 225,500ක් වෙන් කර තිබුණි. කෙසේවෙතත්, එම ප්‍රතිඵලය යටතේ වැඩකටයුතු 2022 අවසන් වනතුරු ආරම්භ කර නොතිබුණි. සැප්තැම්බර්, ඔක්තෝබර, නොවැම්බර් අතිකාල වියදම් සහ ආහාර වියදම් එ.ජ.ඩො 143.90 ට සමාන රු.52,261 ක් වියදම් කර තිබුණි. | ඔක්ස්ෆෑම් කාලය තුළ, පරිපාලක සහ මෙහෙයුම් පිරිවැය සඳහා ඔක්ස්ෆෑම් වෙතින් වෙනම අයවැය ප්‍රතිපාදන තිබුණි. නමුත් ව්‍යාපෘතිය අමාත්‍යාංශයට පැවරීමෙන් පසු මෙහෙයුම් සහ පරිපාලන අයවැය සඳහා එවැනි අයවැයක් නොතිබුණි. එබැවින් අදාළත්වය මත පදනම්ව මෙහෙයුම් සහ පරිපාලන වියදම් සඳහා එක් එක් නිමැවුමෙන් අරමුදල භාවිත කරන ලෙස ආ.සං.බැ උපදෙස් ලබාදෙන ලදි.<br>ප්‍රතිදානය 05 ට අදාළ මෙම ආහාර සහ අතිකාල ගෙවීම මෙම ප්‍රතිදානයට අදාළ බැවින් පිරිවැය ඇතුළත් කරන ලදි. | නිමැවුමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

(6) <u>උපදේශන සේවය</u>

(අ) එ.ජ.ඩො 471,987ක සංශෝධිත ප්‍රතිපාදනවලින් එ.ජ.ඩො 408,217ක් හෙවත් සියයට 86ක මුදලක් 2022 අගෝස්තු 31 දින දක්වා ව්‍යාපෘති කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා වැය කර තිබුණි. කෙසේවෙතත්, එ.ජ.ඩො 2,484,112ක ප්‍රතිපාදනයෙන් රු. මිලියන **179**කට සමාන එ.ජ.ඩො 657,738.19ක් පමණක් ප්‍රතිඵල 5 ආශ්‍රිත කටයුතු සඳහා වැයකර තිබුණි. එය සියයට 26 ක් වැනි ඉතා අඩු කාර්ය සාධන මට්ටමක් විය. උපදේශන සමාගමට අදාළ උපදේශන ගාස්තු කාලානුරූපීව ලැබී තිබුණද, ඔවුන්ගේ යොමුගත ලියවිල්ලේ (TOR) සඳහන් කර ඇති කාර්යයන් නියමිත කාලය තුළ නිසි ලෙස ඉටු කර නොමැති බව නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතියෙන් පිටවන විට උපදේශකවරයා විසින් නියමිත වැඩ 40කට වඩා වැඩි ප්‍රමාණයක් ආරම්භ කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

කෙසේවෙතත්, අදාළ උපදේශන සමාගම සමඟ කිසිදු සාකච්ඡාවක් සිදුවී නොතිබුණු අතර දීර්ඝ කාල සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට කොන්ත්‍රාත්තුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර නිමැවුම් 5 හි වෙන්කිරීමෙන් එ.ජ.ඩො 34,036 ක් මාරු කිරීමට සිදු වි තිබුණි. තවද, හිටපු උපදේශකයාගේ ඉතිරි කටයුතු ඉටු කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දක්වා මාස 04 සඳහා උපදේශන ගාස්තු ලෙස සේවකයින් 09 දෙනෙකුට එ.ජ.ඩො 25,764 ට සමාන රු. මිලියන 9.3ක් ව්‍යාපෘතියට අමතරව දැරීමට සිදුවී තිබුණි.

ආසියානු සංවර්ධන බැංකුවේ අනුමත සහ එකඟ වූ අනුපාතයට අනුව ව්‍යාපෘති උපදේශක ගෙවීම් සිදු කරන ලදි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතියට සාමාජිකයින් කිහිප දෙනෙකු පමණක් සිටී. ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය අඛණ්ඩව සිටීම ඉතා වැදගත් වේ.
මෙම ව්‍යාපෘතියේ දී, ප්‍රදානය හෝ ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් මුදා හැරීමට පෙර බොහෝ මූලික වැඩ නිම කිරීමට අවශ්‍ය වේ.

තවද, ක්ෂේත්‍ර අධීක්ෂණ සහ ඇගයීම් කටයුතු බොහොමයක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. ව්‍යාපෘති කණ්ඩායම මෙය සිදු කරන බැවින් වියදම් කළ මුදල ඉතා අඩුය. නමුත් අයවැය අඩුවෙන් වියදම් කළද බොහෝ කටයුතු අවසන් කරන ලදි.

උදා: ප්‍රදාන නිකුත් කිරීමේ මට්ටමට ප්‍රතිලාභියා ගෙන ඒමට සාමාන්‍යයෙන් මාස 6ක් ගතවේ. මක්නිසාද යත් ව්‍යාපෘති කණ්ඩායමට ඔවුන් ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වන මට්ටමට උසස් කිරීමට අවශ්‍ය වූ බැවිනි.
අයවැය ප්‍රදානයක් ලෙස අරමුදල් මුදා හැරීමෙන් පසු පමණක් පෙන්වන අතර අනෙකුත් ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය නොකරයි.

මෙම උපදේශන ගාස්තුවලට අදාළ සියලුම ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| (ආ) | ගිවිසුමට ඇතුළත් කර ඇති යොමුගත ලියවිල්ලේ (TOR) (D) වගන්තිය අනුව උපදේශන සමාගම විසින් ලබාදිය යුතු ප්‍රධාන නිමවුම්වලින් ආරම්භක වාර්තාව, වාර්ෂික වාර්තාව සහ ISSC සඳහා වසර 5ක් සඳහා වූ උපායමාර්ගික සැලසුම්වල මෘදු පිටපත හැර, අනෙකුත් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවශ්‍ය සියලුම ලියකියවිලි විද්‍යුත් තැපැල හරහා විගණනයට ඉදිරිපත් කර ඇත. (ගොනු බරින් යුක්ත වන අතර ඒවා මෘදු පිටපත් ලෙස පිළිගැනීමට විගණන නිලධාරීන් එකඟ වූ බැවින් මෙවා විද්‍යුත් තැපැලෙන් විගණක වෙත ඉදිරිපත් කරන ලදී. | නියමිත වේලාවට යොමුගත ලියවිල්ල (TOR) අනුව ප්‍රධාන නිමවුම් ලබාදිය යුතුය. |
| (ඇ) | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා ශ්‍රම බලකායේ සංඛ්‍යාලේඛන කාර්තුමය ප්‍රකාශනයට අනුව, 2018 වසරේ සියයට 33.6ක් වූ කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 2022 සිව්වන කාර්තුව වන විට සියයට 31.6 දක්වා පහත වැටී ඇත. තවද, ශ්‍රී ලංකාවේ ඉහළම විරැකියා අනුපාතය අවුරුදු 15-24 වයස් කාණ්ඩයේ එනම් සියයට 29.4ක් වාර්තා වී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ආර්ථිකයේ කාන්තා ශ්‍රම සහභාගිත්වය සියයට 50 දක්වා ඉහළ නැංවීමේ අරමුණින් විදේශ ප්‍රදානයන් මගින් ශ්‍රී ලංකාව තුළ මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කළද අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති විෂය පථය සහ ව්‍යාපෘති ලේඛනයට අනුව, මෙම ව්‍යාපෘතියෙන් වයස අවුරුදු 16 ත් 40 ත් අතර සිටින සාම්ප්‍රදායික නොවන අංශයේ කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සිසුන් පමණක් සලකන ලදී. තවද 70%ක් කාන්තාවන් වේ.<br>එබැවින් ලබා දී ඇති විෂය පථය අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර සැලසුම් අධීක්ෂණ ආකෘතියේ (DMF) ඉලක්කය සාර්ථකව සපුරා ඇත.<br>ජාතික දර්ශකවලට සාපේක්ෂව ව්‍යාපෘති විෂය පථය ඉතා අඩු බැවින් මෙම ව්‍යාපෘතිය ජාතික දර්ශක සමඟ සැසඳිය නොහැක. ව්‍යාපෘතිය මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ව්‍යාපෘති අවශ්‍යතාවයට අනුව මෙම සංඛ්‍යා සාක්ෂාත් කර ගන්නා ලදී. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2** සම්පත් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ලැබී තිබුණු එ.ජ.ඩො මිලියන **3**ක ප්‍රදාන මුදලෙන් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වර්ෂ **04**කට පසුව **2022** දෙසැම්බර් **31** වන විට සියයට **40** ක් නියෝජනය කරන රු. මිලියන **321.71**කට සමාන එ.ජ.ඩො මිලියන **1.21**ක මුදලක් පමණක් භාවිත කර තිබුණි. ඒ අනුව සියයට **40**ක් උපයෝජනයට වර්ෂ **04**ක් ගතවී ඇති අතර සියයට **60**ක් උපයෝජනයට මාස **06**ක් ගතවී ඇති බව නිරීක්ෂණය විය. තවද, සංරචකය ඒ සඳහා සංශෝධිත අයවැයෙන් වෙන් කරන ලද එ.ජ.ඩො මිලියන **2.48**න් **2022** දෙසැම්බර් **31** දිනට | පාස්කු ප්‍රහාරය, වසර දෙකක කොවිඩ් වසංගතය සහ රට වසා දැමීම, ඉන්ධන, විදුලිය සහ අනෙකුත් මූලික අවශ්‍යතා හිඟය ඇතුළු මූල්‍ය අර්බුදය ඇතුළුව වසර 4ක ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘතිය වෙනස් සහ නොවැළැක්විය හැකි තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය. එබැවින් ප්‍රජාව මූලික අවශ්‍යතා පසුපස දුවන විට ව්‍යාපෘතියට සමහර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් නවතා දැමීමට | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදල යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සියයට **31** ක් නියෝජනය කරන එකතුව රු. **220,989,614**කට සමාන එ.ජ.ඩො **773,353**ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. | සිදු විය.<br>තවද මෙම කාලසීමාව තුළ ආසියානු සංවර්ධන බැංකුව සහ අමාත්‍යාංශය විසින් සමහර ව්‍යාපෘති ක්‍රියාකාරකම් වෙනස් කිරීමට සහ ව්‍යාපෘතිය තුළ නවෝත්පාදනයන් වැඩිදියුණු කිරීමට ඉතා බුද්ධිමත් තීරණ ගෙන තිබුණි. නමුත් 2023 ජුනි 30 වන වි ට, ව්‍යාපෘතිය සියලු ව්‍යාපෘති අරමුදල් වියදම් කර එකඟ වූ පරිදි සියලුම සැලසුම් අධීක්ෂණ ආකෘති (DMF) නිමකර ඇත. | |
| (ආ) | ප්‍රදාන මූල්‍ය තොරතුරු පද්ධතියේ තොරතුරුවලට අනුව, **2022** දෙසැම්බර් **31** දිනට එ.ජ.ඩොලර් මිලියන **1.83** ක මුදලක් ලබා දී තිබුණද, නියමිත කාල සීමාවන් තුළ ව්‍යාපෘතියේ නියමිත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් විශේෂ (ඩොලර්) ගිණුමේ සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ එ.ජ.ඩො **622,207**ක මුදලක් නිශ්කාර්යව පැවතුණි. | ව්‍යාපෘතිය අමාත්‍යාංශයට පැවරීමෙන් පසු ව්‍යාපෘතිය සඳහා ඩොලර් බැංකු ගිණුම සහ ශ්‍රීලංකා රුපියල් ගිණුම විවෘත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම මුදල් ගිණුම්වල පැවතුණි. 2023 ජනවාරි මාසය ඇතුළත මෙම මුදල් වියදම් කර ඇත. | කළමනාකාරිත්ව ය විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3** මහා භාණ්ඩාගාරයේ පොත්පත් සමග සැසඳීම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2019 ජූලි 25 දිනැති එස්සී සහ පීඑම්යු/ප්‍රදාන/19 සහ 2020 අගෝස්තු 14 දිනැති එස්සී සහ පීඑම්යු/ප්‍රදාන/20 චක්‍රලේඛ මගින් විදේශ ප්‍රදාන ලැබීම් සහ ගිණුම්කරණය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය අවධාරණය කර තිබුණද, ආසියානු සංවර්ධන බැංකුවෙන් ව්‍යපෘතියට ලැබුණු ප්‍රදානය රු. මිලියන 548.04ක මුදල් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ පොත්පත්වල කිසිදු වාර්තාවක් නොමැති බව නිරීක්ෂණය විය. | ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු තොරතුරුවලට අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නිකුත් කර ඇති අරමුදල් පිළිබඳ මේ සියලු තොරතුරු ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදී ඇත. ආ.සං.බැ අනෙකුත් සියලුම දේශීය ව්‍යාපෘති සඳහා ද අනුගමනය කරන ලද ක්‍රියාවලිය මෙය වේ.<br>ආසියානු සංවර්ධන බැංකුවට අනුව, ව්‍යාපෘතිය සඳහා නිකුත් කර ඇති සියලුම අරමුදල් රජයට වාර්තා කර ඇත. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට කටයුතු කළ යුතුය. |

**3.4** පරිබාහිර කටයුතු

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ආ.ස.බැ ක්ෂේත්‍ර 901 යටතේ අධ්‍යයන හා පර්යේෂණ සඳහා රු. මිලියන 1.92ක් වැය කර තිබුණද ඉහත ක්ෂේත්‍රයේ ඇතුළත් අධ්‍යයන සහ පර්යේෂණ යටතේ නොඑන US$ 4,150 ට සමාන රු. මිලියන 1.41ක වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය. | ඔක්ස්ෆෑම් කාලය තුළ, පරිපාලන සහ මෙහෙයුම් පිරිවැය සඳහා ඔක්ස්ෆෑම් වෙතින් වෙනම අයවැය ප්‍රතිපාදන තිබුණි. නමුත් ව්‍යාපෘතිය අමාත්‍යාංශයට පැවරීමෙන් පසු මෙහෙයුම් සහ පරිපාලන අයවැය සඳහා එවැනි අයවැයක් නොතිබුණි. එබැවින් අදාළත්වය මත පදනම්ව මෙහෙයුම් සහ පරිපාලක වියදම් සඳහා එක් එක් නිමැවුමෙන් අරමුදල භාවිත කරන ලෙස ආ.ස.බැ උපදෙස් ලබාදෙන ලදි.<br><br>මෙම පරිපාලන සහ මෙහෙයුම් පිරිවැය ඒ අනුව මෙම අයවැය සඳහා ඇතුළත් කර ඇත. මෙය ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලදි. | වෙන් කර ඇති අරමුදල් යොදා ගනිමින් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වාහන බැටරියේ වටිනාකම රු.**47,800** උප ක්‍රියාකාරකම් **1.4.3** යටතේ **2701** වැඩමුළු සහ සම්මන්ත්‍රණ ක්ෂේත්‍රය යටතේ ආසියානු සංවර්ධන බැංකුවෙන් ප්‍රතිපූර්ණය කර තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය අමාත්‍යාංශයට පැවරූ විට, ප්ලෑන් ඉන්ටර්නැෂනල් ආයතනය පරිත්‍යාග කරන ලද වාහනය ප්ලෑන් ඉන්ටර්නැෂනල් සතුව තිබුණි. මෙම වාහනය අමාත්‍යාංශයේ හිමිකාරීත්වය යටතේ තබා ගනිමින් ව්‍යාපෘති කටයුතු සඳහා භාවිත කරන ලදි.<br><br>ව්‍යාපෘතියට වාහන අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ආවරණය කිරීමට අවශ්‍ය බැවින්, මෙම බැටරි වියදම් වැඩමුළු අයවැයට ඇතුළත් කර ඇත. මක්නිසාද යත් වාහනය ප්‍රධාන වශයෙන් වැඩමුළු සඳහා භාවිතා කරන බැවිනි. | වෙන් කර ඇති අරමුදල් යොදා ගනිමින් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5** අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|

| | | |
|---|---|---|
| ගිවිසුමේ ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන වගුව 3 ට අනුව, නිපුණතා සංවර්ධන වෘත්තීය පුහුණු අමාත්‍යාංශය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් වෘත්තීය පුහුණු ආයතනවල සාමාජිකයින් සහ කාර්මික සභා සාමාජිකයින්ගෙන් සමන්විත ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් අධීක්ෂණ ආයතනයක් ලෙස ස්ථාපිත කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 133 අනුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ.අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණනය සිදු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති ඒකකයේ අධීක්ෂණය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.<br>සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ මූල්‍ය කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ වැඩසටහන් සහ මූල්‍ය කණ්ඩායම වෙනුවෙන් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ අතිරේක ලේකම් විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලැබේ.<br>අමාත්‍යාංශයේ මූල්‍ය ඒකකය විසින් ව්‍යාපෘති ලේඛන අඛණ්ඩව අධීක්ෂණය කර සමාලෝචනය කරන අතර වාර්තා කිරීම සම්බන්ධයෙන් ණය නියෝජිතායතනය සමඟ සෘජු සන්නිවේදනයක් ඇත. | ක්‍රියාත්මක කිරීමේ ලියවිල්ලේ එකඟ වූ විධිවිධානවලට අනුකූල වීමට හා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ අභ්‍යන්තර විගණනය මගින් විගණනය කිරීමට අවශ්‍ය වේ. |